## 1 වන පරිච්ඡේදය

## වාර්තාගත වියයුතු කරුණු

වර්ෂ 1995 සැප්තැම්බර් මස 21 වන දින දරන අධිකාර පත්‍රයේ සඳහන් කරුණු ගැන පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා, 1950 අංක 8, 1953 අංක 40, 1955 අංක 8, 1955 අංක 29 යන පනත් වලින් සංශෝධිත, 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය ප්‍රකාර අතිගරු ඔබතුමිය විසින් මෙම කොමිෂන් සභාව පිහිටුවනු ලදී. අදාල පරීක්ෂණය කළයුතු වූ කාරණා සම්බන්ධව වඩාත් පුළුල් ක්ෂේත්‍රයකට විහිදෙන අතුරු, කාරණා සැලකිල්ලට ගෙන අතිගරු ඔබතුමිය 1995 දෙසැම්බර් මස 15 වන දින, යට සඳහන් අධිකාර පත්‍රය අවලංගු කර 1995 දෙසැම්බර් මස 15 වන දින දරන නව අධිකාර පත්‍රයක් ප්‍රකාශයට පත් කළේය. මෙම අධිකාර පත්‍රයේ අඩංගුවූ කරුණු ඉක්බිතිව 1995 දෙසැම්බර් මස 19 වන දින හා අංක 902/8 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ( A ඇමුණුම - A 1 හා A 2 ) පළකරන ලදී.

මුල් අධිකාර පත්‍රය අනුව පරීක්ෂණය නිම කොට 1995 සැප්තැම්බර් මස 20 වන දින වන විට වාර්තාව ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවට නියම කරන ලදී. එසේ වුවද, ඉහතින් සඳහන් කරන ලද පරිදි අතිගරු ඔබතුමිය විසින් අලුත් අධිකාර පත්‍රයක් ප්‍රකාශයට පත්කරන ලදී. එම අධිකාර පත්‍රය අනුව, පරීක්ෂණය නිම කොට 1996 මාර්තු මස 14 වන දින වන විට වාර්තාව ඉදිරිපත් කරන ලෙසට මෙම කොමිෂන් සභාවට නියම කරන ලදී. එසේ වුවද, කොමිෂන් සභාවට පරීක්ෂණයට ලක්කරන ලෙස නියම කරන ලද කරුණුවල සංකීර්ණත්වයත් වෙනත් කරුණු රැසකුත් සැලකිල්ලට ගෙන අතිගරු ඔබතුමිය කොමිෂන් සභාවට දෙන ලද එම කාලසීමාව අවස්ථා දොළහක දී (12) දීර්ඝ කළෙනිය. එම කාලසීමාව දීර්ඝ කිරීම්, 1996 මාර්තු මස 13 වන දින, 1996 මැයි මස 29 වන දින, 1996 සැප්තැම්බර් මස 10 වන දින, 1996 දෙසැම්බර් මස 14 වන දින, 1997 පෙබරවාරි 13 වන දින, 1997 මාර්තු මස 05 වන දින, 1987 මැයි මස 14 වන දින, 1997 ජූලි මස 11 වන දින, 1997 සැප්තැම්බර් මස 12 වන දින, 1997 නොවැම්බර් මස 13 වන දින, 1997 දෙසැම්බර් මස 31 වන දින, 1998 ජනවාරි මස 28 වන දින යන දිනයන්හි සිට ක්‍රියාත්මක වන ලෙසට දෙන ලදී. අවසන් වරට දෙන ලද දීර්ඝ කිරීම අනුව මෙම කොමිෂන් සභාවට නියම කරනු ලැබුයේ 1998 මාර්තු මස 26 වන දින වන විට අතිගරු ඔබතුමියට වාර්තාව ඉදිරිපත් කරන ලෙසටය.

1995 දෙසැම්බර් මස 15 වන දින දරන අධිකාර පත්‍රය අනුව, පහත සඳහන් කාරණා ගැන පරීක්ෂා කොට වාර්තා කරන ලෙසට මෙම කොමිෂන් සභාවට නියම කරනු ලැබින:

(අ) 1990 පෙබරවාරි මස 20 වන දින හෝ ඒ ආසන්නයේදී උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට අදාල අවස්ථානුගත කරුණු සහ ඒ අතුරුදහන්වීම ගැන වගකිවයුතු පුද්ගලයින්.

(ආ) 1990 පෙබරවාරි මස 24 වන දින හෝ ඒ ආසන්නයේදී, උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීම හා පසුව රඳවා තබාගැනීමට අදාල

අවස්ථානුගත කරුණු සහ එකී අත්අඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම ගැන වගකිවයුතු තැනැත්තන්.

(ඈ) රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ යම් රඳවා තබාගැනීමේ ස්ථාන 1988 ජනවාරි මස 01 වන දින හා 1990 දෙසැම්බර් මස 31 වන දින අතර කාලසීමාව තුළ පිහිටුවා පවත්වා ගෙන යාම සහ එසේ රඳවා ගෙන සිටි පුද්ගලයින් අමානුෂික හා අවමන් සහගත සැළකිල්ලට (වධදීම් වලට) භාජනය කරනු ලැබුවේද යන වග සහ එකී නීති විරෝධී ක්‍රියාවන්ට වග කිවයුතු පුද්ගලයින්.

(ඇ) ඉහතකී කරුණු සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් පවත්වනු ලැබුවේ ද යන වග සහ යම් තැනැත්තන් විසින් කෙළින්ම හෝ අනියම් ආකාරයෙන් එකී පරීක්ෂණයට මැදිහත් වූයේ ද යන වග.

(ඉ) යම් නීතියක් යටතේ යම් සාපරාධී වැරදි කිරීම සම්බන්ධයෙන් හෝ ඉහතකී යම් කාරණයක් සම්බන්ධයෙන් බලතල අයුතු බලපෑම් කිරීම හෝ වැරදි ලෙස හෝ අයථා ලෙස පාවිච්චි කිරීම සම්බන්ධයෙන් යම් නිලධාරියෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු වගකිවයුතු ද යන වග.

ඉහත සඳහන් කාරණා සම්බන්ධයෙන් උචිත නිර්දේශ ඉදිරිපත් කිරීමටද කොමිෂන් සභාවේ අධිකාර පත්‍රයෙන් කොමිෂන් සභාවට බලය දෙන ලදී.

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ අතිගරු ඔබතුමියට ඔබතුමියගේ අභිමතය පරිදි කොමසාරිස්වරයෙකු ලෙස ඕනෑම තැනැත්තෙකු පත්කිරීමට හැකි වුවද, අතිගරු ඔබතුමිය කොමිෂන් සභාවට කොමසාරිස්වරුන් දෙදෙනෙකු පත්කිරීම සම්බන්ධයෙන් ඔබතුමියගේ ලේකම්තුමා මගින් ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ නිර්දේශ ඉල්ලා සිටි බව අපි දන්නෙමු. ගරු ඔබතුමිය අප පත් කළේ එසේ ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ නිර්දේශ මතය.

කොමසාරිස්වරුන් කොළඹදී නඩු විනිශ්චය සිදුකරන්නාවූ මුල් හා ඇපැල් යන දෙයාකාර නඩු විනිශ්චය සම්බන්ධ අධිකරණ බලය ඇත්තාවූ බස්නාහිර පළාතේ මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් බැවින් අදාල මහාධිකරණ දෙකට එදිනෙදා පැවරෙන අධිකරණ වැඩ කටයුතුවලට බාධාවක් නොවන ලෙසට කොමිෂන් සභාවට සම්බන්ධව වැඩ කටයුතු පස්වරුවට නියම කර ගන්නා ලදී. තවද, කොමිෂන් සභාවේ රාජකාරී පවරනු ලැබූ, නීතිපතිවරයා නියෝජනය කළ රජයේ නීතිඥවරුන් දෙදෙනාටද කොමිෂන් සභාවට සහායවීමට සිදුවූයේ සිය සාමාන්‍ය රාජකාරිවලට අමතරවය. කොමිෂන් සභාව ක්‍රියාත්මකවීම ආරම්භවීමෙන් පසු අධිකාර පත්‍රයේ නිර්ණේය විෂයයන්ගේ අතිශය වැදගත් අංශයන්ට අදාල තොරතුරු, කරුණු හා සාක්ෂි දීමට පෙර නොවූ විරූ සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවක් සිය කැමැත්තෙන්ම ඉදිරිපත් විය. එහෙයින් කොමිෂන් සභාවේ වැඩට වෙන්කොට සිටි විමර්ශකයින්ට පූර්ණ හා විස්තරාත්මක විමර්ශණයන් කිරීමට සිදුවිය. එහෙයින් මුල් අධිකාර පත්‍රයෙහි සඳහන් කර ඇති පරිදි වාර්තාව ඉදිරිපත් කිරීමට කාලසීමාවේ දීර්ඝ කිරීම් ලබාගැනීමට සිදුවිය.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හිටපු නිලධාරියකු වූත්, නීතිඥයෙකු වූත් එස්. ගුණවර්ධන මහතා කොමිෂන් සභාවේ ලේකම් ලෙස පත්කරන ලදී. කෙටි කාලසීමාවක් කොමිෂන් සභාවේ ලේකම් ලෙස කටයුතු කළ ගුණවර්ධන මහතා 1996 පෙබරවාරි මස 01 වන දින සේවයෙන් ඉල්ලා අස්විය. කෙටි කාලසීමාවකට සහකාර ලේකම් ඩේවිඩ් ගීගනගේ මහතා වැඩබලන ලේකම් ලෙස පත්කරනු ලැබුවේය. ඉක්බිතිව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන පංතියේ 1 වන ශ්‍රේණියේ නිලධාරියෙකු වූ ජී.කේ.ජී. පෙරේරා මහතා 1996 ජුනි මස 07 වන දින ලේකම් ලෙස පත්කරන ලදී. පෙරේරා මහතා කොමිෂන් සභාව අවසන් වන තෙක්ම එහි ලේකම් ලෙස මෙහි "E" ඇමුණුමෙහි නම් දැක්වෙන නිලධාරී මණ්ඩලයේ සහාය ඇතිව රාජකාරී කළේය.

ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ හිටපු රජයේ අධි නීතිඥයකුද , ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ( 1996 ) මානව අයිතිවාසිකම් කමිටුවේ සභාපතිවරයා ද වූ අතර, සුප්‍රසිද්ධ අපරාධ නඩු බොහෝ සංඛ්‍යාවකට රජය වෙනුවෙන් මෙන්ම විත්තිය වෙනුවෙනුත් පෙනී සිට ඇත්තාවූ ජනාධිපති නීතිඥ ආර්.අයි. ඔබේසේකර මහතාට කොමිෂන් සභාවට සහායවීමට ඉදිරිපත් වන ලෙස කොමිෂන් සභාව විසින් ආරාධනා කරන ලදී. කොමිෂන් සභාවට සහායවීමට රජයේ නීතිඥයින් දෙදෙනෙකු නම් කිරීමට එවකට ඇටෝර්නි ජනරාල්වරයා වූ ජනාධිපති නීතිඥ ශිබ්ලි අයිස් මහතාට කරන ලද ආරාධනයක් අනුව, සරත් ජයමාන්න හා යසන්ත කෝදාගොඩ යන රජයේ නීතිඥවරුන් දෙදෙන නම් කරන ලදුව, රාජකාරී පවරනු ලැබිණ. දැනට ඇටෝර්නි ජනරාල් ධූරය දරන ජනාධිපති නීතිඥ ගරු සරත් එන්. සිල්වා මහතා විසින් පෙරකී රජයේ නීතිඥවරුන් දෙදෙනාට, ඔවුන්ගේ අප්‍රමාද අවධානයට ලක්වීම අවශ්‍ය වූ වෙනත් වෘත්තීයමය රාජකාරී කිරීමට ඔවුන්ට පවරා තිබුනේ වී නමුත් කොමිෂන් සභාව අවසානය දක්වා ඊට සහායවීම කරගෙන යාමට කාරුණිකව අවසර දෙනු ලැබිණ. සාක්ෂිකරුවන්ගේ සාක්ෂි පරීක්ෂාව මෙම නීතිඥවරුන් තිදෙනා විසින් කරන ලදී.

කොමිෂන් සභාවට අවශ්‍ය විමර්ෂණයන් කිරීමට, නියෝජ්‍ය පොලිස්පති ටී.වී. සුමනසේකර සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එස්.සී. පතිරණ යන මහතුන්ගේ ප්‍රධානත්වයෙන් යුත් පොලිස් නිලධාරී කණ්ඩායම් දෙකක් කොමිෂන් සභාවට සහාය විය. පොලිස් අධිකාරී එච්.එච්.එම්.ආර්. ප්‍රේමරත්න මහතා, ටී. වී. සුමනසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් වූ ( අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ) විමර්ෂන කණ්ඩාමයට, කොමිෂන් සභාව පත්කිරීමට ප්‍රථමයෙන් අධිකාර පත්‍රයේ යම් යම් අංශවලට අදාල ප්‍රාරම්භක විමර්ශණයන් කිරීමට අධාර කරන ලදී. කොමිෂන් සභාව පිහිටුවීමේදී එම තොරතුරුද සලකා බලන ලද බව අපට දැනගන්නට ලැබින. මෙම කොමිෂන් සභාව ආරම්භ වීමෙන් පසුවද, පෙරකී නිලධාරී කණ්ඩායම ඔවුන් විසින් එවකටත් විමර්ෂණ පවත්වා ඇති යම් යම් කාරණා සම්බන්ධයෙන් විමර්ෂණ පැවැත්වීම තවදුරටත් කරගෙන ගියේය. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එස්.සී. පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් වූ විමර්ෂන කණ්ඩායම කොමිෂන් සභාවට ස්ථිර පදනමින් අනුයුක්ත කරන ලද නිලධාරීන්ගෙන් යුක්ත විය. මෙම කණ්ඩායමට ඊට විමර්ෂන පවත්වා වාර්තා කරන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරන ලද සියළු කාරණා ගැන විමර්ෂන පවත්වා කෙළින්ම කොමිෂන් සභාවට වාර්තා කළේය. විමර්ෂණ ඒකකවල සේවය කළ පොලිස් නිලධාරීන්ගේ නම් "D" ඇමුණුමෙහි දැක්වේ.

කොමිෂන් සභාවේ අධිකාර පත්‍රයට හා තීර්ණෙය විෂයයන්ට පෙර නොවූ විරූ ලෙසින් පොදු මහජනයාගේ අවධානය යොමු විය. මෙය බොහෝ සෙයින්ම කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතුවලට මුද්‍රිත මෙන්ම විද්‍යුත් මාධ්‍ය විසින් දෙන ලද පුළුල් ප්‍රචාරය නිසා විය හැකිය පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණ එම කටයුතු නිරීක්ෂණය කළ බවද

නිරීක්ෂණයට ලක්විය. කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වෙන ස්ථානවලට නිදහසේ හා බාධාවක් නොමැතිව පැමිණ එහි වැඩකටයුතු නැරඹීමට මහජනයාට හැකිවිය. කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ජනමාධ්‍යවල පළවූ වාර්තාවලට එලදායී ප්‍රතිචාරයක් ඇතිවිය. කොමිෂන් සභාවට භාර කාරණා පරීක්ෂණයට ලක් කිරීමෙන් පැන නැඟි කාරණා ගැන ඉතා වැදගත් තොරතුරු කොමිෂන් සභාවට ලැබිණ. කොමිෂන් සභාවේ කටයුතුවලට ඉහළ මට්ටමක මහජන සහභාගීත්වයක් තිබූ බව සඳහන් කිරීමට කොමිෂන් සභාව කැමතිය. මෙයින් පෙනී ගියේ, පරීක්ෂණයට භාජනව තිබෙන කාරණා සම්බන්ධ සත්‍යාසත්‍ය භාවය තමන්ට ද විමසා දැනගැනීමට තදබල සැලකිල්ලක් හා උනන්දුවක් මහජනයා තුළ තිබුණු බවය.

ඇතැම් දිනවල කොමිෂන් සභාවේ කටයුතු නිසි අයුරු සිදුවන්නට සැළසීමටත්, කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි සාක්ෂිකරුවන්ගේ ආරක්ෂා සහිත බව හා ඔවුන්ට බියක් ඇති නොවීම සහතික කරනු පිණිසත් විශේෂ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සිදුවිය. එක්තරා දිනෙක, එනම්, ගරු විරුද්ධ පක්ෂ නායකතුමා සාක්ෂි දීමට පැමිණි දිනෙක, කොමිෂන් සභාවේ හා අවට වූ කොළඹ මහාධිකරණ සංකීර්ණයේ උසාවිවල කටයුතු කඩා කප්පල් වීමක් සිදුවූ බව වාර්තාගත කරන්නේ කණගාටුවෙනි. මෙය සිදුවූයේ පෙරකී සාක්ෂිකරුට ජයඝෝෂා කිරීම සඳහා කොමිෂන් සභා පරිශ්‍රයට හා ඒ අවට ප්‍රදේශයට පැමිණි පුද්ගලයින් විසින් කිසියම් ප්‍රමාණයකට අසංවරව හා නොහික්මුණු ලෙසට හැසිරීම නිසාය. එක් මොහොතක කොමිෂන් සභා උසාවි කාමරය තුළ සිටි අයට හොඳින් හැසිරෙන ලෙසට අවවාද කිරීමට කොමිෂන් සභාවට සිදුවිය.

කොමිෂන් සභාවේ නිර්ණේය විෂයයන්ට සම්බන්ධ නියෝජනයන් කැඳවමින් සිංහල, දෙමල හා ඉංග්‍රීසි භාෂා දිනපතා පුවත්පත්වල දැන්වීම් පළකිරීමට කොමිෂන් සභාව විසින් සළස්වන ලදි. ( "B" ඇමුණුමෙහි මෙම දැන්වීම්වල පිටපත් පළවේ.) නම හා ලිපිනය සඳහන් කරමින් අදාල ලිඛිත නියෝජනයන් ඉදිරිපත් කළ පුද්ගලයින්ගෙන්, පළමුව කොමිෂන් සභාවට සහාය වන පොලිස් නිලධාරීන් විසින් ප්‍රශ්න කරන ලදි. ඉක්බිතිව, කොමිෂන් සභාවේ නිර්ණේය විෂයයන් තුළට වැටෙන කාරණා ගැන විශ්වසනීය තොරතුරු සැපයිය හැකි යයි කොමිෂන් සභාව සළකන අය කොමිෂන් සභාව විසින් සාක්ෂිකරුවන් ලෙසින් කැඳවනු ලැබූහ. සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශන වාර්තාගත කර ගැනීම හා ඔවුන් කැඳවීම පිළිබඳ සියළුම තීරණ ගනු ලැබුවේ කොමසාරිස්වරුන් විසින් බව සැලකිල්ලට ගතයුතුය. තවද, එක් සාක්ෂිකරුවෙකුගේ ප්‍රකාශයේ ස්වභාවය සළකා බැලූ කොමිෂන් සභාව ඔහුගේ ප්‍රකාශය රහස්‍ය ලෙස වාර්තාගත කොට ගැනීමට තීරණය කළේය. අනිකුත් සියළුම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි කොමිෂන් සභාවේ විවෘත රැස්වීම්වලදී වාර්තාගත කර ගන්නා ලදි.

පරීක්ෂණ කොමිෂන් සභා පනතින් විධිවිධාන සළසා ඇති පරිදි සාක්ෂිකරුවන් නීතිඥයින් මගින් නියෝජනය කරනු ලැබීමට කොමිෂන් සභාව අවසර දුන්නේය. එම නීතිඥයින්ට තම තමන්ගේ සේවාදායකයින්ට විරුද්ධව සාක්ෂි දුන් සාක්ෂිකරුවන් විභාග කිරීමට එම ඉඩ දෙන ලදි. මෙම විභාගය හරස් ප්‍රශ්න ඇසීමක ස්වරූපය ගත් අතර, එම ක්‍රියාවලියේදී නීතිඥවරු සාක්ෂිකරුවන්ගේ විශ්වාසනීයත්වය දෝෂ දර්ශනයට ලක්කිරීමටත් , තම සේවා දායකයින්ගේ වාසියට සිටින සාක්ෂි ලබාගැනීමටත් තැත් කළහ. රහසේ සාක්ෂි දුන් එකම සාක්ෂිකරුද එසේ පරීක්ෂාවට භාජනය කරනු ලැබිණ. එසේ වුවද, යම් යම් සාක්ෂිකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින්, එම සාක්ෂිකරුවන්ට විරුද්ධව නඟා තිබෙන චෝදනා ප්‍රතික්ෂේප කළ අතර, තමන්ගේ සේවාදායකයින්ට විරුද්ධව කලින් සාක්ෂි දී ඇති සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ඉදිරිපත්වී නොමැති බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්ව තිබේ. උචිත අවස්ථාවලදී මෙම

කොමිෂන් සභාව, යම් යම් සාක්ෂිකරුවන්ට විරුද්ධව කලින් සාක්ෂි දී ඇති සාක්ෂිකරුවන් විභාගයට ලක් නොකිරීම සම්බන්ධයෙන් බැස ගන්නා ලද අනුමිති අඩ වශයෙන් පාදක කොටගෙන තීරණවලට එළඹ ඇත. විශේෂයෙන් සඳහන් කළයුතු තවත් කරුණක් නම්, සාක්ෂිකරු ( එනම්, වැඩ තහනම් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී) ඩග්ලස් පීරිස් ගේ ( මෙම පොලිස් නිලධාරියා කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කැළණිය පොලිස් කොට්ඨාශයේ මෙහෙයුම් දක්ෂ ලෙස සැලසුම් කොට ක්‍රියාත්මක කළ මහ මොළකාරයා යයි කියනු ලැබේ . තවද, මෙම ඒකකය බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ සිට ක්‍රියාත්මක වූයේ යයිද කියනු ලැබේ.) අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පෙනී සිටි නීතිඥයා වූ නලින් ලද්දුවහෙට්ටි මහතා කොමිෂන් සභාවෙන් සාධාරණ විනිශ්චයක් තමාට බලාපොරොත්තු විය නොහැකි යයි කියමින් හදිසියේ කොමිෂන් සභාවෙන් පිටව ගිය අතර, විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මහතා කොමිෂන් සභාවට කැඳවන තුරු කොමිෂන් සභාවට නොපැමිණ සිටියේය. එකී අවස්ථාවෙහි මෙකී නීතිඥවරයා වික්‍රමසිංහ මහතාගේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ නැත වශයෙන් පෙනී සිටි හිටපු ඇටෝර්නි ජනරාල් ජනාධිපති නීතිඥ තිලක් මාරපන මහතාගේ කණිෂ්ඨ නීතිඥවරයකු ලෙස කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියේය. පිට පිට දෙදිනක් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි මාරපන මහතා කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු ගැන කොමිෂන් සභාව ඉදිරියේ විරෝධයක් නො පෑ ය. පෙරකී අධි නීතිඥවරයා කණිෂ්ඨ සහායකයා ලෙස සිටියදී මාරපන මහතා තවදුරටත් ප්‍රයෝජනවත් ලෙස කොමිෂන් සභාවට ආධාර කළේය. තවද විශ්‍රාමලත් ප්‍රධාන පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ (කලින් සඳහන් කළ කඩා කප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය භාර නිලධාරියා) වෙනුවෙන් පෙනී සිටි අධි නීතිඥවරයා වූ නෙවිල් අබේරත්න මහතා මුල සිටම කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි අතර, එහි අවසානය දක්වාම එහි සැසිවාරවලට සහභාගී විය. සාක්ෂිකරුවන් වෙනුවෙන් පෙනීසිටි සියළුම නීතිඥවරුන්ගේ නාම ලේඛණයක් "C" ඇමුණුමෙහි දැක්වේ.

ඩග්ලස් පීරිස් මහතා ස්වේච්ඡාවෙන්ම 1996 පෙබරවාරි මස 02 වන දින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් තමා වෙනුවෙන් පෙනී සිටින ලෙස නීතිඥ නලින් ලද්දුවහෙට්ටි මහතාට උපදෙස් දුන්නේය. මේ අනුව, තමන් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටි සියළුම සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ඔහුට අවස්ථාව ලබාදෙන ලදී. එසේ වුවද කොමිෂන් සභා කටයුතු සිදුවූ දින කිපයකින් පසු පීරිස් මහතා කොමිෂන් සභාවේ කටයුතුවලට සහභාගීවීමෙන් වැළකී සිටින්නට විය. කොමිෂන් සභාව ඒ ගැන විමර්ෂණයක් කළේ නැත. කුමක් නිසාද යත්, පීරිස් මහතාට සියළුම දිනවල කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට බලකිරීමක් නොතිබුණු නිසා හා ඔහුට එසේ පෙනී සිටීමට සිතාසි නිකුත් කොට නොතිබුණු නිසාත්ය. ඉක්බිතිව කලින් සඳහන් කරන ලද පරිදි 1996 .07.10 වන දින ලද්දුවහෙට්ටි මහතාත් කොමිෂන් සභාවෙන් පිටවී ගිය අතර, කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමෙන් වැළකී සිටියේය. පීරිස් මහතා රහසිගතව රටින් පිටවී ගොස් තිබෙන බව ඊට නොබෝ කලකට පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොමිෂන් සභාවේ සැලකිල්ලට භාජනය කළේය. ඊට පසු පීරිස් මහතා කොතැනක සිටිද යන්න විමර්ෂනය කර බලන ලෙස කොමිෂන් සභාව විමර්ෂකයින්ට නියම කළේය. කුමක් නිසාද යත්, ඒ වන විට ඔහුගෙන් ප්‍රශ්න කොට ඔහුගේ ප්‍රකාශය වාර්තාගත කර ගැනීමට කොමිෂන් සභාවට අවශ්‍ය වූ හෙයිනි. කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතුවලට අදාලව ඔහු පරීක්ෂාවට ලක්කිරීමත් අවශ්‍ය විය. පීරිස් මහතා බොරු නමක් සඳහන් ව්‍යාජ ගමන් බලපත්‍රයක් උපයෝගී කර ගනිමින් ඉන්දියාව හා තායිලන්තය හරහා ස්විට්සර්ලන්තයට ගොස් තිබෙන බව විමර්ශනවලින් හෙළිවී තිබෙන බව 1995 ඔක්තෝබර් මස 15 වන දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එච්.එච්.එම්.ආර්. ප්‍රේමරත්න මහතා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කීය. ඔහු ස්විට්සර්ලන්තයට සම්ප්‍රාප්තවී දේශපාලන රැකවරණය සොයා

ඇත. ඉක්බිතිව, පිරිස් මහතාට විරුද්ධව සාක්ෂිකරුවන් රැසක් විසින් එල්ල කර ඇති චෝදනා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිලධාරීන්ට ඔහුගෙන් ප්‍රශ්ණ කිරීමට අවසර දෙන ලෙසට ස්විට්සර්ලන්ත නීති බලධාරීන්ගෙන් ඉල්ලා සිටීමට කොමිෂන් සභාව ගරු ඇටෝර්නි ජනරාල්වරයාගේ ආධාරය ඉල්ලා සිටියේය. කරන ලදැයි කියන ලද වරදවල් බොහොමයක්ම පැහැරගෙන යාම්, මිනිමැරුම්, පුද්ගලයින්ට වධදීම්, අයුතු ලෙස පුද්ගලයින් රඳවා ගැනීම් ආදී වූ ස්වභාවයේ ඒවා විය. එම ක්‍රියා සියල්ලක්ම මානව අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝණය කිරීම් විය. පිරිස් මහතාට විරුද්ධව ඇති ලබාගැනීමට තිබෙන කරුණුවල සම්පිණ්ඩනයක්ද "ඇමුණුං කොමිෂන් රොගොටරි වාර්තාවක්" උචිත රාජ්‍ය තාන්ත්‍රික මාර්ග වලින් ස්විට්සර්ලන්ත බලධාරීන් වෙත සපයන ලදැයි ද, ස්විට්සර්ලන්ත බලධාරීන් ඊට පිළිතුරු සපයන අවස්ථාව වන විට, දේශපාලන රැකවරණ පතා ඔහු විසින් කරන ලද ආයාචනය ස්විට්සර්ලන්ත බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කරන ලදුව, ඔහු ස්විට්සර්ලන්තයෙන් අතුරුදහන්වී සිටියේ යයි ද ගරු ඇටෝර්නි ජනරාල්වරයා නියෝජනය කළ නීතිඥ තැන විසින් කොමිෂන් සභාවට දන්වන ලදී. ඊට පසු කොමිෂන් සභාවේ රැස්වීම් අවසන් වන තුරුම පිරිස් මහතා ගැන කිසිම තොරතුරක් කොමිෂන් සභාවට ලැබුනේ නැත. කෙසේ වුවද, පිරිස් මහතා විසින් එවන ලදැයි අදහස් කරන ලද දිවුරුම් පත්‍රයක් 1996 අගෝස්තු මස 14 වන දින කොමිෂන් සභාවට ලැබුනේය. මෙය මින් පසුව එන පරිච්ඡේදයකදී සලකා බලනු ලබනවා ඇත.

යම් යම් පුද්ගලයින් සාපරාධී වැරදි සිදුකර ඇති බවත් ඔවුන්ගෙන් සමහර දෙනා නිර්ණේය විෂයයන්හි සඳහන් වන කාරණාවලට සම්බන්ධ බවත් හඟවන මුල් බැල්මට පෙනෙන සාක්ෂි ඇති බව සාක්ෂි වාර්තාගත කරගැනීමේදී හෙළිවිය. පරීක්ෂණ කොමිෂන් සභාවලට පැවරී තිබෙන්නේ සීමිත බලතල වන අතර, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ මොහු එබඳු පුද්ගලයින්ට "නොතීසි" නිකුත් කළ නොහැකිය. එහෙයින් කොමිෂන් සභාව විසින් පරීක්ෂාවට ලක් කළයුතු වූ සියළුම පුද්ගලයෝ සාක්ෂිකරුවන් ලෙසින් කැඳවනු ලැබූහ. එසේ වුවද, කොමිෂන් සභාවේ වැඩ කටයුතු ඉදිරියට යත්ම කොමිෂන් සභාව ඉදිරියේ තුන් වර්ගයක පුද්ගලයින් සාක්ෂි දුන් බව පෙනී ගියේය. එම තුන් වර්ගය මෙසේය:

I. තමන්ට විරුද්ධව හෝ තමන් දන්නා හඳුනන පුද්ගලයින්ට විරුද්ධව සාපරාධී වැරදි කරන ලදැයි පැමිණිලි කළ අය.

II. නිල සාක්ෂිකරුවෝ ( ඔවුන්ට විරුද්ධ චෝදනා නොතිබිණි)

III. නිර්ණේය විෂයයන්හි විස්තර කොට දක්වා ඇති සාපරාධී වැරදි හා වෙනත් කාරණාවලට කෙලින්ම හෝ අනියමින් සම්බන්ධ යයි කියනු ලබන පුද්ගලයින්.

( සියළුම සාක්ෂිකරුවන්ට යවන ලද සිතාසි වල ආදර්ශ පිටපතක් "F" ඇමුණුමෙහි දැක්වේ.)

කොමිෂන් සභාවේ ප්‍රසිද්ධ රැස්වීම 1996 ජනවාරි මස 16 වන දින ආරම්භ වූ අතර, එය එකසිය විසිහත් දිනෙක (127) රැස්විය. පුද්ගලයින් අසූ දෙදෙනෙකුට (82) සිතාසි භාරදෙන ලදුව, කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි අතර ඔවුන්ගේ සාක්ෂි විවෘත රැස්වීම්වලදී සටහන් කරගනු ලැබිණ. කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන්ගේ නම් හා ලිපිනයන් "G " ඇමුණුමෙන් දැක්වේ. නඩු භාණ්ඩ අයිතම හා ලියවිලි එකසිය විසිහයක් (126ක්) සාක්ෂිකරුවන්

විසින් ඉදිරිපත් කරන ලදුව සලකුණු කරනු ලැබිණ. ඉදිරිපත් කරන ලද ද්‍රව්‍ය හා ලියවිලිවල ලැයිස්තුවක් "H" ඇමුණුමෙහි දැක්වේ. මේ කොමිෂන් සභාවේ විමර්ශකයින් විසින් ප්‍රකාශ සටහන් කර ගත් පුද්ගලයින් සංඛ්‍යාවෙන් ඉතා සුළු කොටසක් බව සැළකිල්ලට ගත යුතුය. තීරණ හා අනුමැතිවලට එළඹීමේදී කොමිෂන් සභාව කොමිෂන් සභාවට ලබාගතහැකිව තිබුණු සියළුම විශ්වාස කටයුතු හා අදාල කරුණු කොමිෂන් සභාව විසින් සළකා බලන ලද බව මෙම අවස්ථාවේ වාර්තාගත කරනු කැමතිය. මේ අතරට යට සඳහන් ප්‍රකාශද ඇතුළත් විය. එසේම සංඛ්‍යා ලේඛණ හා වෙනත් තොරතුරු ලැයිස්තුකොට දක්වමින් රජයේ සංවිධාන විසින් වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් කොමිෂන් සභාව ඉදිරියට පත් කල විශ්වාස කටයුතු වාර්තාද සළකා බලන ලදී.

කොමිෂන් සභාවේ සියළුම රැස්වීම් පවත්වනු ලැබුයේ කොළඹ 12, අලුත්කඩේ, මහාධිකරණ සංකීර්ණයේ පිහිටි කොළඹ මහාධිකරණ උසාවි අංක 2 දී ය. එම රැස්වීම්වල සභාපතිත්වය දැරූ විනිශ්චයකාරතුමා වූයේ කොමිෂන් සභාවේ සභාපතිවරයාය. මෙම ක්‍රියා මාර්ගය නිසා කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වීමට පරිශ්‍ර ලබාගැනීමෙන් වන වියදම වැළැක්වීමට කොමිෂන් සභාවට හැකිවිය. කොමිෂන් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලය පිහිටියේ අළුත්කඩේ උපරිමාධිකරණ සංකීර්ණයේ අංක 301A දරන කාමරයේය. ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා තවත් කාමරයක් මහාධිකරණ සංකීර්ණයේ පැවැත්විණ. කෙලින්ම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි එස්. සී. පතිරණ මහතා යටතේ සේවය කල ස්ථිර විමර්ෂන නිලධාරී කණ්ඩායම කොළඹ 7, කැප්පෙටිපොළ මාවතේ සමිටි තට්ටු නිවාස වල අංක 18 හි පිහිටි කාර්යාලයකින් ක්‍රියාත්මක විය. සාක්ෂිකරුවන්ගෙන් ප්‍රාරම්භක වශයෙන් ප්‍රශ්න කර ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර ගන්නා ලද්දේ මෙහිදීය.

කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු ශ්‍රව්‍ය පටිවල වාර්තා කොට ගනිමින් ලඝුලේඛනගත කරගෙන ඊට අනතුරුව යතුරුලියූ කටයුතු වාර්තා ලෙසින් සකසන ලදී. මෙම කටයුතු වාර්තා පිටු 6780ක් වූ අතර, වෙලුම් 28 කින් ( සලකුණු කල ලියවිලි) යුක්ත විය. එම වාර්තා හා විමර්ෂකයින් විසින් ප්‍රකාශ සටහන් කරගත් සියළුම පුද්ගලයින්ගේ ප්‍රකාශ සහ සලකුණු කෙරුණු ලියවිලි මේ සමග ඉදිරිපත් කරනු ලැබේ.